**මාතලේ මහා නගර සභාව**
**මාතලේ දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 02 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 23 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 21 දින සභාවේ නගරාධිපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මාතලේ මහා නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂනය කරනු ලැබේ.

(අ). මහා නගර සභාවේ කසළ කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා තායිලන්තයේ Asian Institute of Technology (AIT) ආයතනයෙන් 2011 වර්ෂයේදී ලැබී තිබුණු රු.704,539ක ව්‍යාපෘති ආධාර සංචිත ගිණුමකට බැරකර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී එකී ආධාර මුදල් වැය කිරීම සඳහා ඒ වෙනුවෙන් 2012 මැයි 10 දින පරිපූරක අයවැයක් සම්මත කරවාගෙන ඉන් රු.423,300ක මුදලක් වැයකර තිබුණි. මේ අනුව ඉහත ආධාර මුදල් ආදායමට බැරකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තවදුරටත් සංචිත යටතේ රු.704,539ක ශේෂයක් දක්වා තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි තානායම් ගාස්තුව රු.845,250ක් වුවද එය රු.362,250ක් ලෙස එනම්, රු.483,000ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයට අදාල කඩ කුලී අධිගාස්තු රු.963,834ක් වරෙන්තු ගාස්තු හා දඩ ආදායම් ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව බිල්කළ කඩ කුලී ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ). කඩ කාමර 73ක් බදු දීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ රු.17,140,068ක් ලැබිය යුතු ආදායම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

---

(ඉ). වර්ෂ ගණනාවකට පෙර අනවසර ඉදිකිරීම් වෙනුවෙන් ලබා ගන්නා ලද සේවා ගාස්තු රු.154,180ක් හා කොම්පෝස්ට් බැරල් විකිණීමෙන් ලබා ගන්නා ලද ආදායම් රු.763,850ක් ශේෂ පත්‍රයේ සංචිත යටතේ දක්වා තිබුණි.

(ඊ). ඉකුත් වර්ෂයට අදාල සමාලෝචිත වර්ෂයේ වැය කරන ලද රු.780,091ක වියදම් සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසාගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාලව 2013 වර්ෂයේ ගෙවන ලද රු.1,105,822ක වියදම් අයිතම 57ක් වෙනුවෙන්ද ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණි.

(උ). සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගන්නා ලද රු.806,078ක් වටිනා යන්ත්‍ර හා ලී බඩු සවිකිරීම් විෂයයන් 17ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඌ). 1995 සිට 2012 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ප්‍රතිපූර්ණය කර ගතයුතු දේපළ ණය පොලී හා වැටුප් හා දීමනා එකතුව රු.2,588,996ක් ණයගැතියන් ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව පෙර ගෙවුම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(එ). සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂවලදී මිලදීගෙන තිබුණු හා පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වාහන 09ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ). 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ලැබී තිබුණු විනෝද බදු මුදල්, වාහන නවතා තැබීමේ ගාස්තු හා සෙවනත ආයතනයේ කුලී ආදායම් වශයෙන් එකතුව රු.1,453,375ක් අදාල පරිදි ගිණුම් තැබීමකින් තොරව තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඔ). පසුගිය වසර 07ක කාලයක් සඳහා ගෙවිය යුතුව තිබූ රු.3,008,430ක විගණන ගාස්තු සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සළසා නොතිබුණි.

(ඕ). සභාව යටතේ පැවති වාහන සේවා ස්ථානය, අන්තර් සම්බන්ධිත කුට්ටිගල් වැඩපල සහ බ්ලොක් ගල් වැඩපල සඳහා දරනු ලබන වියදම් සහ එමගින් උපයන ආදායම් පිළිඹිබු වන පරිදි උපගිණුම් නඩත්තු කිරීම සහ සමාලෝචිත වර්ෂයට අදාලව එමගින් උපයන ලද දළ ලාභය ගණන් බැලීමේ ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි. මේ හේතුවෙන් එමගින් උපයන ලද ලාභය / අලාභය ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

1.3. 2 නොසැසඳු ගිණුම්

ගිණුම් විෂයයන් 04කට අදාලව පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව, උපයෝගී ලේඛන හා වාර්තා අනුව ශේෂයන්ගේ එකතුව අතර රු.11,185,667ක වෙනසක් පැවතුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ). පිළිතුරු නොලත් විගණන විමසුම්

2013 ජූනි 30 දින වන විට විගණන විමසුම් 10කට පිළිතුරු සපයා නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළහැකි ගනුදෙනුවල වටිනාකම රු.3,530,394 ක් විය.

(ආ). තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.119,700,240ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,638,875ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,814,652ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1992 සිට 2009 වර්ෂය දක්වා අවස්ථා 06කදී පුරහල ගාස්තු, විදුලි බිල්, කුලී හා වරිපනම් ගාස්තු වෙනුවෙන් ලැබී තිබූ වටිනාකම රු.79,915ක් වූ චෙක්පත් අගරු වී තිබූ අතර, ඒ සම්බන්ධව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 189ට අනුව කටයුතු කිරීමෙන් තොරව අගරු චෙක්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 261(3) නියමයට පටහැනිව බැංකු ගිණුම් 02ක 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රමාණවත් මුදල් ශේෂයක් නොමැතිව තිබියදී රු.3,234,625 ක් වටිනා චෙක්පත් 86 ක් නිකුත් කර තිබුණි.

(ඇ). 1999 සිට 2012 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාලව අවස්ථා 45කදී කාර්යය මණ්ඩලය වෙත දෙන ලද අත්තිකාරම් රු. 866,255ක් හා 1994 සිට 2007 දක්වා කාලපරිච්ඡේදයට අදාලව අවස්ථා 10කදී බාහිර පාර්ශවයන් වෙත දෙන ලද අත්තිකාරම් රු.141,004ක් 2013 ජූලි 15 විගණන දින වන විටත්, පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. ' 000 |
| (i). වරිපනම් හා බදු | 34,990 | 38,123 | 18,797 |
| (ii). බදු කුලී | 16,428 | 14,521 | 3,782 |
| (iii). බලපත්‍ර ගාස්තු | 4,580 | 5,547 | 58 |
| (iv).වෙනත් ආදායම් | 156,332 | 168,377 | 13,791 |

2.3.2 බදු කුලී

(අ). මහා නගර සභා ආඥා පනතේ 253(1) වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කර හිඟහිටි බදු කුලී හා නිවාස කුලී අයකර නොගැනීම නිසා 2003 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව සභාව සතු දැනට බදු දී ඇති කඩ කාමර 108කින් හා ලොතරැයි කුටි, වැසිකිළි හා නිවාස ඒකක 38කින් බදු කුලී රු.2,782,175ක මුදලක් හිඟහිටව පැවතුණි.

(ආ). සභාව සතු කඩ කාමර බදුදීමේ ගිවිසුම් අනුව කඩ කාමර ඉදි කිරීම සඳහා එකවර ගෙවිය යුතු මුදලින් වාරික වශයෙන් ගෙවීමට ඉඩදී තිබුණු කඩ කාමර 73ක එකවර ගෙවිය යුතු මුදල් රු.17,140,068ක් 2003 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 විගණන දිනය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතු වෙළඳ සංකීර්ණ 03ක කඩ කාමර 63ක් වර්ෂ ගණනාවක සිට වසා දමා තිබීම හේතුවෙන් සභාවට වර්ෂයකදී උපයාගත හැකිව තිබූ ආදායම් රු.756,000ක් අහිමි වී තිබුණි.

(ඈ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛයේ 07 ඡේදය හා කඩ කාමර බදු ගැනුම්කරුවන් සමඟ එළඹ තිබුණු බදු ගිවිසුමේ 26 ඡේදයට අනුව බදු ගැනුම්කාර පාර්ශවය විසින් දේපළ විකිණීම, පැවරීම හෝ අතුරු බදුදීම නොකළ යුතු බව දන්වා ඇතත්, සභාව සතු කඩ කාමර 93ක් බදු ගැනුම්කරුවන් විසින් විවිධ පාර්ශවයන්ට අතුරු බදු දී තිබුණි. රු.1,000 සිට රු.3,000 දක්වා පරාසයක බදු කුලී මුදලකට බදුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ ඇතත්, බදුකරුවන් විසින් රු.8,000 සිට රු. 20,000 දක්වා පරාසයක වටිනාකම් මත අතුරු බදුදී තිබූ බවක් නිරීක්ෂණය වූයෙන් 2012 වර්ෂය තුළ දළ වශයෙන් රු.8,928,000ක මුදලකින් සභා අරමුදලට පාඩු සිදුව තිබුණි.

(ඉ) 2004 වර්ෂයේදී මුද්‍රා තබන ලද කඩ කාමර 14ක් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හෝ නැවත ප්‍රසම්පාදනය කර වෙනත් පාර්ශවයකට පැවරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමෙන් තොරව විගණන දිනය වූ 2013 ජනවාරි 31 දින වන විටත්, එම කඩ කාමර වසා දමා තිබුණි.

2.3.3 වෙළඳ බලපත්‍ර ගාස්තු

(අ). 1989 ජනවාරි 20 දිනැති අංක 541/17 දරන ශ්‍රී ලංකා ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ iv (ආ) කොටසේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථා සංග්‍රහයේ xx වැනි කොටසේ 21 පරිච්ඡේදය අනුව සත්‍ය වශයෙන්ම වෙළඳ ව්‍යාපාර කරගෙන යන පාර්ශවයන් නමින් වෙළඳ බලපත්‍ර නිකුත් කළයුතු වුවත්, ඊට පටහැනිව අතුරු බදු දී ඇති බදුකරුවන් 93 දෙනෙකු නමින් වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.46,995ක හිඟහිටි වෙළඳ බලපත්‍ර ගාස්තු ආදායම අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව අධිකතා ඌනතා ගිණුමට හරකර තිබුණි.

2.3.4 වෙනත් ආදායම්

(අ). මහා නගර සභා ආඥා පනතේ 247(අ)(2) වගන්තියේ විධිවිධාන පරිදි යම් හෝටලයක්, ආපනශාලාවක් හෝ නවාතැන්පොලක් වශයෙන් පාවිච්චි කරනු ලබන සභා බල ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති හෝටල් හා නවාතැන්පොලවල් තුනකින් සමාලෝචිත වර්ෂයේ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ). සභාව සතු ජල සැපයුම් පද්ධතිය 2001 වර්ෂයේ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත පවරාදීමේදී පැවති හිඟ ජල ගාස්තු රු.4,802,812 ක ශේෂයක් අදාල ජල පාරිභෝගිකයන් වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 1,870,710 |
| (ii). | මුද්දර ගාස්තු | 11,920,160 |

2.4 අධිභාර

මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාරවලට අදාලව 2012 දෙසැම්බර් 31 දිනට රු.50,861ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

2.5 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

---

(අ). සභාව සතු සුපිරි වෙළඳ සංකීර්ණයේ වර්ග අඩි 15,472කින් සමන්විත දෙවන මහල කොන්ක්‍රීට් කුළුණු යොදා වහළය පමණක් ඉදිකර තිබුණු අතර, එකී ගොඩනැගිල්ලේ දෙවන මහල අඩුපාඩු සම්පූර්ණ කර ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා ගැනීමෙන් තොරව 2001 වර්ෂයේ සිට නිශ්කාර්යයව පැවතුණි.

(ආ). රු.5,691,132ක් වටිනා වාහන හා උපකරණ විෂයයන් 09ක් හා වටිනාකම සඳහන් නොවූ විෂයයක් නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතින.

(ඇ). මූල්‍ය ප්‍රකාශන අනුව මෝටර් රථ හා කරත්ත ගිණුමේ දක්වා තිබුණු රු.23,123ක් වටිනා පැරණි Rack for the mobile Library යනුවෙන් සඳහන් ඒකකයක් 1997 වර්ෂයේ සිට සභාවට අයත් යාන්ත්‍රික වැඩපල භූමියේ දිරාපත් වීමට ඉඩහැර ඉවත දමා තිබුණි.

(ඈ). නිශ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවති වටිනාකම සඳහන් නොවන භෞතික සම්පත් ඒකක 84 ක් පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

## 2.6 අවිධිමත් ගනුදෙනු

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ)** බලංගොඩ නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයේ පවත්වන ලද පුහුණු වැඩමුළුවකට මාතලේ මහා නගර සභාවේ නිලධාරීන් හා සේවකයින් 12 දෙනෙකු නේවාසිකව දින 02ක් සහභාගි කරවා තිබුණද, එක් දිනකට නිලධාරීන් හා සේවකයින් 20දෙනෙකු වෙනුවෙන් ආහාර හා නවාතැන් සඳහා රු.72,195ක් වියදම් දරා තිබුණු අතර, ඊට අදාල රු.13,248ක අධිගෙවීමක් සිදුවී තිබුණි.

(ආ) 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව විදේශ ගමන් සඳහා යානාපත්‍ර ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගම හෝ මිහින් ලංකා (පුද්ගලික) සමාගම වෙතින් පමණක් මිලදී ගතයුතු බවත්, වෙනත් ආයතනයකින් යානාපත්‍ර මිලදී ගනු ලබන්නේ නම් අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු බව දක්වා ඇතත්, ඊට පටහැනිව සුනාමි ව්‍යාපෘතිය යටතේ කසළ කළමනාකරණය සම්බන්ධව ඉන්දියාවේ නවදිල්ලි නගරයේ හා නේපාලයේ කත්මණ්ඩු නුවර පැවති වැඩමුළු සඳහා නගරාධිපතිවරයා, නාගරික මන්ත්‍රීවරුන් දෙදෙනෙකු, නාගරික කොමසාරිස්වරයා ඇතුළු නිලධාරීන් දෙදෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ අවස්ථා දෙකකදී පෞද්ගලික ආයතනවලින් ගුවන් යානාපත්‍ර මිලදීගෙන රු.428,500 ක් වැයකර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXX වැනි පරිච්ඡේදයේ 1:3 හා 1:4 වගන්තිවලට අනුව අමාත්‍යාංශ ලේකම්වරයාගේ පූර්ව අවසරය ඇතිව මිස කිසිදු නිලධාරියෙකු පළාත් පාලන ආයතනයකට, රාජ්‍ය සංස්ථාවකට හෝ වෙනත් පොදු ආයතනයකට හෝ කිසිදු පෞද්ගලික පාර්ශවයකට සේවයක් ඉටු කිරීමට භාර නොගත යුතු බව හා නිලධාරියෙකු තම සාමාන්‍ය රාජකාරි කටයුතුවලට පරිබාහිර වූ කාර්යයක් ගාස්තුවක් ලබා ඉටුකරදීමට භාරගැනීමට පෙර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අවසරය ලබාගත යුතු බව දක්වා තිබුණද, එවැනි අවසරයක්

---

ලබා ගැනීමෙන් තොරව සභාවේ නිලධාරීන් 06 දෙනෙකු විසින් සුනාමි ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ හා අනෙකුත් රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.1,188,363ක දීමනා ලබාගෙන තිබුණි. මෙම ගෙවීම් සඳහා සභා අනුමැතියක් ද ලබාගෙන නොතිබුණි. දීමනා ගෙවීම වෙනුවෙන් වැඩකළ කාලය පිළිබඳ නිශ්චිතව සටහන් තබාගෙන නොතිබුණු අතර, අධීක්ෂණ නිලධාරියෙකු විසින් අධීක්ෂණය කළ ආකාරය දැක්වෙන අයුරින් හා අනෙකුත් නිලධාරීන් කරන ලද කාර්යයන් පැහැදිලිව දක්වමින් කළවැඩ වාර්තා නඩත්තු කර නොතිබුණි

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9:3:1(ආ) ඡේදය ප්‍රකාරව රු.100,000කට වැඩි අළුත්වැඩියා සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එවැනි අනුමැතියක් ලබාගැනීමකින් තොරව අංක GR – 0758 දරන ජේසීබී යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අළුත්වැඩියා උපාංග මිලදී ගැනීම වෙනුවෙන් රු.1,005,780ක් වැයකර තිබුණි

(ඉ) ගුවන් යානාපත්‍ර 05 ක් මිලදී ගැනීම වෙනුවෙන් වූ යානාපත්‍ර ගාස්තු රු.333,500ක මුදල අදාළ ආයතනයට සෘජුවම ගෙවීම් කිරීමේ හැකියාව තිබියදී 2012 ජනවාරි මාසයේදී නේපාලයේ කත්මණ්ඩු නුවර පැවති විදේශ වැඩමුළුවට යෑම සඳහා රු.303,164 ක මුදලක්, 2012 ජනවාරි 20 දින නාගරික ඉංජිනේරු වෙත අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. ඉන් මාස 08 කට පසුව අත්තිකාරම් මුදල් පියවීමේදී යානාපත්‍ර සඳහා වෙන්වූ මුදලින් ඉතිරි මුදල් ලබාදෙන ලෙස නාගරික ඉංජිනේරුගේ ඉල්ලීමට අනුව ඔහු වෙත රු.30,335ක් නැවත ගෙවා තිබු

(ඊ) සභාව සතු එක්ස්කැවේටර් යන්ත්‍රය 2012 අගෝස්තු හා ඔක්තෝබර් මාසවලදී විටින් විට අක්‍රියවී ඇතත්, එය අළුත්වැඩියා කිරීමට කටයුතු කිරීමකින් තොරව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන හෝ වෙනත් විධිමත් ක්‍රමයක් අනුගමනය කිරීමකින් තොරව අත්මිල ගණන් ලබාගෙන විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව අවස්ථා 02 කදී බාහිර පාර්ශවකරුවන් දෙදෙනෙකුගෙන් එක්ස්කැවේටර් යන්ත්‍රයක් කුලී පදනම මත සේවයේ යොදවා තිබූ අතර, යන්ත්‍ර කුලී ලෙස සමාලෝචිත වර්ෂය තුළ රු.648,900ක් ගෙවා තිබුණි. එසේ සේවය ලබාගත් යන්ත්‍ර සැපයුම්කරුට එවැනි යන්ත්‍රයක් හෝ එවැනි ව්‍යාපාරයක් නොමැති බව කරන ලද තහවුරු කිරීම්වලදී නිරීක්ෂණය විය.

(උ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ viii වැනි පරිච්ඡේදයේ 6.2 ඡේදය ප්‍රකාරව පොරොත්තු රාජකාරි සඳහා අතිකාල දීමනා ගෙවිය හැක්කේ සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයෙන් අඩක් බැගින් වුවද, ඒ අනුව කටයුතු කිරීමකින් තොරව ගිනි නිවන අංශයේ ගිනිභටයින් දෙදෙනෙකු සඳහා සම්පූර්ණ ගාස්තු ප්‍රමාණයම අතිකාල දීමනා වෙනුවෙන් ගෙවා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.99,604ක අතිකාල දීමනා වැඩිපුර ගෙවා තිබුණි.

(ඌ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1:4, 3:4 හා 3:6 ඡේද අනුව තරඟකාරී මිල සැඳැහුම් ක්‍රමය අනුගමනය කර, මිලදී ගැනීම් කළයුතු වුවත්, එසේ කිරීමකින් තොරව අත්මිල ගණන් මත අවස්ථා 10කදී රු.1,431,662 ක විවිධ මිලදී ගැනීම් සිදුකර තිබුණි.

(එ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 264 ප්‍රකාරව සෑම ගෙවීමකටම අදාල කුවිතාන්සි වවුචරය සමඟ ඉදිරිපත් කළයුතු වුවත්, අවස්ථා 03කදී රු.110,150ක මිලදී ගැනීම් සම්බන්ධව අදාල කුවිතාන්සි වවුචරයට අමුණා නොතිබුණි.

2.7 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

(අ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 610 ප්‍රකාරව විදේශාධාර සම්බන්ධ සියළු කරුණු විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මගින් කළ යුතුය. එකී නියමයට පටහැනිව සූන්‍යා ව්‍යාපෘතිය සඳහා International Council for Local Environmental Initiatives (ICLEI), South Asia නැමති රාජ්‍ය නොවන සංවිධානයක් මගින් යුරෝපීය සංගමයේ රු.2,526,255ක විදේශාධාර සභාව විසින් සෘජුවම ගිවිසුම්වලට එළඹ ආධාර ලබාගෙන තිබූ අතර, එම අරමුදල් උපයෝජනය මගින් කසළ කළමනාකරණ කටයුතු කෙරෙහි ඵලදායී දායකත්වයක් ලැබී තිබූ බවක් අනාවරණය නොවීය.

(ආ). කසළ කළමනාකරණය සම්බන්ධව ඉන්දියාවේ නවදිල්ලි නගරයේ හා නේපාලයේ කත්මණ්ඩු නුවර පැවති වැඩමුළු සඳහා නගරාධිපති, නාගරික මන්ත්‍රීවරු දෙදෙනෙකු හා සභාවේ නිලධාරීන් දෙදෙනෙකු සහභාගි කර වීම හා ඒ සඳහා දරන ලද රු.976,861ක වියදම් සම්බන්ධව සභා අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

2.8 කසළ කළමනාකරණ පුහුණු වැඩ මුළුව.

පහත කරුණු කිරික්ෂණය කරනු ලැබේ.

(අ) 2012 නොවැම්බර් 29 දින සිට 2012 දෙසැම්බර් 01 දින දක්වා බලංගොඩ පැවති කසළ කළමනාකරණ පුහුණු වැඩමුළුවට යෑම සඳහා යොදාගෙන තිබූ සභාව සතු අංක 61-4253 දරන වාහනයේ ධාවන සටහන අනුව කි.මී.215ක් ධාවනය කිරීම සඳහා පැය 11ක් හා ආපසු පැමිණීමට පැය 13ක් ගතකර තිබුණි. අංක PB-7108 දරන වාහනයේ ධාවන සටහන අනුව එම පුහුණු වැඩමුළුවට යෑම සඳහා කි.මී.280ක් ධාවනය කිරීමට පැය 18ක් ගත වී තිබූ අතර විගණනයේදී පිළිගත නොහැකි අයුරින් දුර ප්‍රමාණයන් හා කාලයන් දක්වා තිබුණි. පුහුණු වැඩමුළුව නිම වීමෙන් පසු PB-7108 දරන වාහනය කොළඹ හරහා මාතලේ පැමිණීමට කි.මී.436ක දුරක් ධාවනය කර ඇති බව දක්වා තිබුණද, බලංගොඩ සිට කොළඹ යෑමට හේතු අනාවරණය නොවුණි.

(ආ). බලංගොඩ යාම සඳහා සභාවට අයත්, වෑන්රථ දෙකක් යොදාගෙන නිලධාරීන් ප්‍රවාහනය කර තිබියදී එම වැඩමුළුවට යාමට ප්‍රවාහන පහසුකම් සඳහා පෞද්ගලික ආයතනයකින් කුලී පදනම මත වාහනයක් ලබාගෙන රු.14,400ක් ගෙවූ බවට ව්‍යාජ බිල්පත් ඉදිරිපත් කර තිබුණි.

(ඇ). පුහුණු වැඩමුළු 02ක් වෙනුවෙන් සහභාගි වූ නිලධාරීන් සඳහා ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xiv වැනි පරිච්ඡේදයේ 4:1 වගන්තිය ප්‍රකාරව යැපීම් සහ නවාතැන් වෙනුවෙන් රු.34,534ක සංයුක්ත දීමනා ගෙවා තිබියදී එකී නිලධාරීන් සඳහා නවාතැන් හා ආහාර වෙනුවෙන් රු.263,500ක් සභා අරමුදලින් වැය කර තිබුණි.

2.9 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කැන්දගොල්ල අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීමට අවශ්‍ය රු.50,000ක ද්‍රව්‍ය යථෝක්ත මාර්ගයට යාබද ඉඩමේ පදිංචිකරුවෙකු වෙත 2012 අප්‍රේල් 18 දින නිකුත් කර එම ඉදිකිරීම ඉටුකරවාගෙන තිබුණි. ඉහත මාර්ගය සභාවට පවරාගත් මාර්ගයක් හෝ පොදු මාර්ගයක් නොවන අතර පෞද්ගලික ඉඩමකට පිවිසීමට ඉදිකරන ලද මාර්ගයක් බව 2012 ජූලි 20 දින කරන භෞතික පරික්ෂාවේදි නිරීක්ෂණය විය.

(ආ) අන්තර් සම්බන්ධිත කුට්ටිගල් ව්‍යාපෘතියේ 2012 මාර්තු 16 සිට ජූලි 01 දින දක්වා නිෂ්පාදනය කරන ලද කුට්ටිගල් පිළිබඳව පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පරික්ෂණ විද්‍යාගාරයේ හා මාර්ග සංවර්ධන අධිකාරියේ පරික්ෂණ විද්‍යාගාරයන් වෙතින් ලබා ගන්නා ලද පරික්ෂණ වාර්තාවලට අනුව නිෂ්පාදිත ගල් නියමිත ප්‍රමිතියට අනුකූල වී නොතිබුණු බව නිරීක්ෂණය විය. යථෝක්ත කුට්ටිගල් නිෂ්පාදන සම්බන්ධ විධිමත් අධීක්ෂණයක් සිදුවූ බවට ලේඛනගත සාක්ෂි කිසිවක් අනාවරණය නොවුණි. එසේම රසායනාගාර පරීක්ෂණවලින් අසමත් අන්තර් සම්බන්ධිත කුට්ටිගල් යොදා කළ ඉදිකිරීම් පිළිබඳ 2013 ජූලි 08 දින සිදුකරන ලද භෞතික පරික්ෂාවේදී අතුරා තිබුණු ගල් ඉතා දුර්වල ප්‍රමිතියෙන් යුතු බවට අනාවරණය විය. මේ අනුව එකී ගල් නිෂ්පාදනය කිරීම සඳහා දරන ලද රු.647,307ක මුදල සභා අරමුදලට සිදු වූ අලාභයක් බව නිරීක්ෂණය විය.

(ඇ) සභා කාර්යාලය ඉදිරිපිට මිදුලේ අන්තර් සම්බන්ධිත කුට්ටිගල් ඇල්ලීම සඳහා ගල් 12,000ක් නිකුත් කර ඇතත්, භෞතික පරික්ෂණයට අනුව වර්ග මීටර 01කට ගල් 40ක් වැයවන පදනම මත ව.මී.237.70ක් වෙනුවෙන් කුට්ටිගල් 9,508ක් අතුරා ඇති බවක් 2013 ජූලි 18 දින කරන ලද පරික්ෂයේදි නිරීක්ෂණය වූයෙන් රු.79,744ක් වටිනා කැටගල් 2,492ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

2.10 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඇ)ට අනුව, කටයුතු කිරීමකින් තොරව 2009 සිට 2012 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අයත් රු.115,549ක් වටිනා චෙක්පත් 23ක් තැන්පත් ගිණුමේ සටහන් කර තිබුණි.

---

(ආ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 880 හා මධ්‍යම පලාත් ප්‍රධාන ලේකම්ගේ 2003 අප්‍රේල් 11 දිනැති අංක සීපීසී/සීඑස්/06/06/02 දරන චක්‍රලේඛය ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින්/සේවකයින් 25දෙනෙකුගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි.

(ඇ). 1995 සිට 2011 දක්වා කාලපරිච්ඡේදය තුළ පළාත් පාලන කොමසාරිස්ගෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු දේපළ ණයපොලී හා වැටුප් ප්‍රතිපූර්ණ රු.2,879,180ක් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ). විශ්‍රාම ගන්වනු ලැබූ නිලධාරින් 128 දෙනෙකුගෙන් අයවිය යුතු රු.393,592ක් හා 2002 වර්ෂයේ ස්ථාන මාරු ලැබ ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.383,070ක ණය ශේෂ අයකර නොතිබුණි.

(ඉ). සභාව සතු එක්ස්කැවේටර් යන්ත්‍රය මහා නගර සභාවේ කසළ බැහැර කරනු ලබන වාරියපොල වත්තේ සේවයේ යොදවාගෙන තිබියදී 2012 ඔක්තෝබර් මාසයේදී අක්‍රිය වී තිබූ අතර, මාස 06කට අධික කාලයක් අනාරක්ෂිතව කසළ භූමියට මීටර් 300ක් පමණ දුරින් පිහිටි බාහිර ස්ථානයක විවිධ කාලගුණික බලපෑම් වලට හසුවෙමින් තිබුණි. එසේම එම යන්ත්‍රය අනාරක්ෂිතව තිබියදී එම යන්ත්‍රයේ පැති 03ක වාමුවා විනාශ කර තිබුණද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඊ). මහා නගර සභා ආඥා පනතේ xiii වන කොටස 267 (1) ඡේදය ප්‍රකාරව ආඥා පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යැයි පෙනී යන අතුරු ව්‍යවස්ථා කලින් කළ සෑදීමද, එසේ සෑදූ පසු ඒ අතුරු ව්‍යවස්ථා ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමද මහා නගර සභාව විසින්ම කළ යුතුය. එසේ වුවත්, 2012 මාර්තු සිට ආරම්භ කර පවත්වාගෙන යන අන්තර් සම්බන්ධිත කුට්ටිගල්(Inter Lock) හා සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් එවැනි අතුරු ව්‍යවස්ථාවක් සම්මත කරගෙන නොතිබුණු අතර, ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර පළාත් පාලන කොමසාරිස් හා අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතියක් ලබා ගැනීමටද, කටයුතු කර නොතිබුණි.

2.11 හඳුනාගත් පාඩු හා හානි

පහත කරනු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ඉකුත් වර්ෂයේ පුස්තකාල සමීක්ෂණ වාර්තාවට අනුව මාතලේ මහජන පුස්තකාලයේ හා අලුවිහාරේ පුස්තකාලයෙහි රු.80,339ක් වටිනා පුස්තකාල පොත් 647ක හා වටිනාකම ගණනය කර නොතිබූ පුස්තකාල පොත් 491ක ඌනතාවයක් නිරීක්ෂණය වී තිබුණත්, 2013 ජූලි 15 දිනැති විගණන දින වන විටත්, එකී ඌනතාවය සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

(ආ). රු.99,110ක් වටිනාකම ඇති අත් කරත්ත 11ක් හා සංඛ්‍යාව හඳුනාගත නොහැකි රු.544,507ක් වටිනා කරත්ත හා රු.3,471,010ක් වටිනා ට්‍රැක්ටර්, ට්‍රේලර් හා පාපැදි යනුවෙන් දක්වන ලද විෂයයන් 03ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

(ඇ). 2003 වර්ෂයේදි අනාවරණය වූ රු.546,237ක තොග ඌනතා ශේෂයක් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් තොරව වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඈ). 2005 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එන මුදල් අයකැමි වංචා කළ මුදල් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.26,549ක ශේෂය පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.12 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ). සභා බලප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය ටොන් 28.4ක් පමණ දිනකට එකතුවන අතර, එකී ඝන අපද්‍රව්‍ය වලින් ටොන් 24ක් පමණ කිසිදු ප්‍රතිචක්‍රීයකරණ වැඩපිළිවෙලකට යොමු කිරීමකින් තොරව මාතලේ වාරියපොල වතුයායේ සුදු ගඟට මායිම් වූ කොටසකට මුදා හරින බව නිරීක්ෂණය විය. මේ නිසා ඇති වූ පාරිසරික හා ජන ජීවිතයට බලපා ඇති ගැටළු නිරාකරණය කිරීමට ද, කිසිදු වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

(ආ). එක්සත් ජාතීන්ගේ ආසියා පැසිපික් කලාපීය ආර්ථික හා සමාජයීය කොමිසමෙන් (UNESCAP) 2007 වසරේ ලබාගත් රු.4,500,000ක ප්‍රතිපාදන මත මාතලේ ඩෝල පාරේ නගර සභාව සතු ඉඩමක ඉදිකරන ලද කොම්පෝස්ට් අංගනය හා මධ්‍යම පරිසර අධිකාරියේ ජාතික පිළිසරු ව්‍යාපෘතිය යටතේ ලබාගත් රු.2,752,812ක මූල්‍යාධාර මත 2010 වර්ෂයේ ඉදිකරන ලද හිග්ගොල්ල කොම්පෝස්ට් අංගනයේ පොහොර නිෂ්පාදන කටයුතු සඳහා අවුරුදු 30ක කාලයකට 2007 හා 2010 වර්ෂවලදී ගිවිසුම්ගතව පෞද්ගලික ආයතනයක් වෙත පවරා දී තිබුණි. සභා බලප්‍රදේශය තුළ දෛනිකව එකතු කරනු ලබන කසළ ටොන් 04ක් පමණ සභාවේ සේවකයින් හා ට්‍රැක්ටර් මගින් අදාල අංගන වෙත ප්‍රවාහනය කරදෙනු ලබන අතර, සභාවේ කම්කරුවන් 06 දෙනෙකු පූර්ණකාලීනව මෙම ව්‍යාපෘති සඳහා යොදවා ගනිමින් සභාව මගින් වැටුප් ගෙවනු ලබයි. කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹ තිබුණ ද සභාව එකී කටයුතු ගාස්තු හෝ කිසිදු ප්‍රතිලාභයක් ලබා නොගෙන පෞද්ගලික ආයතනයකට පවරා දී තිබුණි.

2.13 කාර්ය සාධනය

(අ). සමාලෝචිත වර්ෂයේ සභාව විසින් ඇස්තමේන්තු කර තිබූ ආදායම් මාර්ගවලින් එකතු කරගත හැකිව තිබූ ආදායම රු.118,418,371ක් වූ අතර, සභාව පවත්වාගෙන යාමට වර්ෂය තුළ දරන ලද වියදම රු.205,652,504ක් විය. ඒ තුළ අඩංගු සභාවේ සේවක වැටුප් සඳහා දරා තිබූ වියදම රු.131,650,195ක් වී තිබුණි. මේ අනුව සේවක වැටුප් ගෙවීම සඳහා හෝ සභාව එකතු කළ ආදායම ප්‍රමාණවත් නොවී තිබුණු අතර, සභාව ඇස්තමේන්තු කළ හා කළයුතුව ඇති ආදායම් මාර්ග තුළ ආදායම් වැඩිකර ගැනීමට අවශ්‍ය ක්‍රමෝපායන් කිසිවක් අනුගමනය කර නොතිබුණි.

---

(ආ). සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙන් සෝසාතකාගාරයක් ඉදිකිරීම සඳහා රු.1,000,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, එකී කාර්යය ඉටුකර නොතිබුණි.

2.14 අභ්‍යන්තර විගණනය

(අ) 1989 ජනවාරි 20 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ අංක 541/17 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ iv (ආ) කොටසේ පලකළ සම්මත අතුරු ව්‍යවස්ථා සංග්‍රහයේ III වැනි කොටසේ 13 ඡේදය ප්‍රකාරව සභාවේ සහ එහි සේවකයන්ගේ හා නියෝජිතයන්ගේ ගිණුම්, මූල්‍ය හා වෙනත් මෙහෙයුම් පිළිබඳ කොමසාරිස්වරයා විසින් ස්වාධීනව පාලනය කරනු ලබන අඛණ්ඩ අභ්‍යන්තර විගණනයක් පවත්වාගෙන යායුතු බව දක්වා ඇතත්, ස්වාධීනව හා ප්‍රමාණාත්මක අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. එසේ වුවත්, අභ්‍යන්තර විගණන ඒකකය සඳහා නිලධාරින් දෙදෙනෙකු හා කාර්යාල කාර්යය සහායකයෙකු යොදවා ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.734,092ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 134(3) හි විධිවිධානවලට අනුව ආයතනයේ මුදල් කටයුතුවලට අදාල අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත යොමුකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ කිසිදු අභ්‍යන්තර විගණන වාර්තාවක් විගණකාධිපති වෙත යොමුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ). ගිණුම්කරණය
(ආ). අභ්‍යන්තර පාලනය
(ඇ). මූල්‍ය පාලනය
(ඈ). ආදායම් පරිපාලනය
(ඉ). වත්කම් කළමනාකරණය
(ඊ). තොග පාලනය
(උ). ණයගැති හා ණයහිමි පාලනය